# තිස් වස් පිරුණු
# එක්සත් රාජධානියේ සිංහළ සංගමය

එක්සත් රාජධානියේ සිංහළ සංගමය පිහිටුවා අවුරුදු 30 ක් සම්පූර්ණ විය.

තිස් වසරක් යනු දීර්ඝ කාලයකි. සංගමයක් හෝ සංවිධානයක් ඒසා දිගු කලක් විදේශයක පවතින්නට හැකිවීම එහි සාර්ථකත්වයේ මා හැඟි සාධකයකි. එක්සත් රාජධානියේ සිංහළ සංගමය ද මෙතෙක් ආ ගමන මැන බැලිය යුත්තේ එය මුහුණ දුන් අභියෝග සහ එය විසින් ඉටුකරන ලද කාර්‍යයන් සලකා බැලීමෙනි. ඒවා විදේශයේ සහ අප මව්බිමේ වෙසෙන සිංහලයින්ගේ සැනසීමට හේතුවේ නම් ඒ ප්‍රමාණවත් ය. ප්‍රශංසාව සහ අත්පොලසන් නාදය හදවතින්ම එහි අඩංගු ය.

අධිරාජ්‍යවාදයේ මූලස්ථානය ලෙස සැලකෙන එංගලන්තයේ වසන සුළු ජන කොටස් තමනට ආවේනික සංස්කෘතීන් අමතක නොවනු පිණිස සිය රටවැසියන් එකතුකරගෙන සංවිධාන සංගම් සෑදීමට බොහෝ කලකට පෙර යොමුවූහ. එය සාමාන්‍යයෙන් ඕනෑම විදේශ රටක වුව සිදුවන්නකි. ඒ ආකාරයට දැනට තිස් වසරකට පෙර එංගලන්තයේ ශ්‍රී ලාංකික සංගම් ද කීපයක් බිහිව තිබුණේය. ඒ අතුරින් සිංහළ සංගමය සංස්කෘතික නැඹුරුව අතින් සිටියේ ඉදිරියෙනි. ඒ දිනවලම ඇරඹූ සෙසු සංගම් ටික කලකින් නැතිවී ගියේය. දැන් මෙන් ජනවාර්ගික කළබල කිසිවක් නොතිබුණු, එමෙන්ම මෙතරම් ශ්‍රීලාංකික ජනතාවක් නොසිටි, එකල දැන් වාගේ නිතර ශ්‍රීලාංකික වැඩසටහන්, නැටුම්, ගැයුම් හා උත්සව ලන්ඩනයේ පැවැත්වුණේ නැත.

සිංහල සංගමය වාර්ෂිකව සිංහළ අවුරුදු උත්සවයක් පවත්වන්නට කටයුතු සැලැස්වූවා ය. එකල මෙහි සිටි නැටුමට හා ගැයුමට දක්ෂ සිංහළ දරු දැරියෝ එම අවුරුදු උත්සවයන්හි නැටුම් ගැයුම් ඉදිරිපත් කළහ. ලංකාවේ අප දුටු ප්‍රවීන වැඩසටහන් මෙන් නොවූවත් ඒවා මෙහි සිංහල ජනයාට තම මව්බිම පිළිබඳව සොම්නස් මතක යන් ගෙන එන්නට ප්‍රමාණවත් විය. එසේම එංගලන්තයේ හැදෙන වැඩෙන දරුවන්ට තම දෙමාපියන් උපන් දේශය හා සම්බන්ධ උත්සව, සංස්කෘතික සංදර්ශණ ආදියට සහභාගිවන්නට ලද අවස්ථාව ද එය වීය.

සිංහළ සංගමය තවත් විශේෂ කාර්‍යයකට මුල පිරුවා ය. එනම් ප්‍රවීන ගායන ශිල්පී වික්ටර් රත්නායකයන් වාදන ශිල්පීන් හය දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සමග ලන්ඩනයට ගෙන්වා 1980 ජුනි 12 වෙනි දින පොදුරාජ්‍ය මණ්ඩලීය ශාලාවේ **ස** ප්‍රසංගය වේදිකා ගතකිරීමයි. එය මෙහි වෙසෙන සිංහල සංගීත ශ්‍රාවකයින්ට දුන් ඉහළම සංග්‍රහයකි. ඒ වන විට සම්පූර්ණ වාද්‍ය වෘන්දයක් සමග කිසිදු ගායන ශිල්පියෙක් ලංකාවෙන් එක්සත් රාජධානියට පැමිණ සිටියේ නැත. එසේම කිසිම විදේශ රටකට ගොස් සිටියේ ද නැත. අද දවස වන විට ලොව පුරා රටවල ශ්‍රීලාංකික ගායන ශිල්පීන් නාට්‍යකරුවන් ප්‍රසංග පැවැත්වීම සුලභ දෙයක්ව ඇත. එහෙත් සම්පූර්ණ වාදක මණ්ඩලයක් සහිත ගී ප්‍රසංගයක් විදේශයේ රටක පැවැත්වීමට මුල පිරීමේ ගෞරවය එක්සත් රාජධානියේ සිංහළ සංගමයට හිමිවේ.


ඩග්ලස් වික්‍රමරත්න මහතා ජිනීවාහි සමුළුවකදී

මේ අතර 1983 වසරේ ජූලි මාසයේ ශ්‍රීලංකාවේ ඇතිවූ දෙමළ සිංහළ කෝලහල නිසා නොසෑහෙන අවදානම් තත්වයකට මුහුණ පාන්නට ශ්‍රීලාංකිකයිනට සිදුවිය. ඒ ජාතිවාදී කරදර සිංහළ දෙමළ මුස්ලිම් කාටත් එකසේ බලපෑවේය. එහෙත් ඉන් කිසියම් වාසියක් ද දෙමළ ජනයාට සැළසිණ. එනම් ඒ කරදරවල මුවාවෙන් යුරෝපීය රටවලට සරණාගතයින් ලෙස එන්නට ඔවුන්ට අවස්ථාව උදාවීමයි. මේ අස්සේ එංගලන්තයේ බීබීසී ආයතනය ඒ දිනවල ශ්‍රීලංකා අර්බුදයට වැඩි ප්‍රචාරයක් දෙමින් නිතර විවාද සහ විවිධ වැඩසටහන් ඉදිරිපත් කළේය. ඒ වැඩ සටහන්වලදී ලන්ඩනයේ සිටි දෙමළ නීතිඥවරු, කථිකාචාර්‍යවරු වහ වහා ඉදිරිපත් වෙමින් ශ්‍රීලංකාවේ සිංහලයින් එහි රජයේ ද සහාය ඇතිව දෙමළ සංහාරයක් සිදුකරන බවත්, දෙමළ ජනයා දැඩි තාඩන පීඩන වලට මුහුණ දෙමින් අසරණව සිටින නිසා බටහිර රටවල් වහා මැදිහත් වී මේ අවුල බේරා දියු යුතු බවටත් විශාල කලබැගෑනියක් කළහ.

ගාඩියන් වැනි ඉංග්‍රීසි පුවත්පත් ද ශ්‍රීලංකා රජයට හා සිංහලයින් මත වරද පටවන්නට වූහ. බටහිර ප්‍රවෘත්ති විකාශන ඒ දිනවල සැබෑ චිත්‍රය වසන්කර ඒක පාක්ෂික ස්වරූපයක් ගත්තේය. මෙහිදී සිංහලයින්ගේ පැත්ත කියවුනේම නැත. රූපවාහිනී පුවත්වල දී සැටලයිට් තාක්ෂණය මගින් ලංකාවේ මැති ඇමතිවරුන්ගේ ප්‍රකාශන විකාශනය කළත් ඒවා ඉතා දුර්වල කියුම් විය. බටහිරට පෙනුණේ සියල්ලෙහි සම්පූර්ණ වරද ඇත්තේ සිංහලයින් අතේ බව ය.

කොටි සංවිධානය ඊළම් ගොඩනගන්නට මුදල් එකතුකරන්නට පටන්ගත්තේය. ඒ මුදල් යොදවා බටහිර පුවත් ආයතනයන්හි මාධ්‍යකරුවන් මිළට ගෙන ඔවුන්ගේ ප්‍රචාරක වැඩ යුරෝපයේ ප්‍රචලිතකිරීමද ඇරඹුවේය. බීබීසී සාකච්ඡාවලට සිංහල පැත්ත ගැන කතකරන්නට කෙනෙක් නැද්දැයි අසමින් ඒ යුගයේ සිංහළයින් සිටියේ දැඩි සිත් අමාරුවෙනි.

ඒ කටුක අවාසනාවන්ත යුගයේ දී වාසනාවට සිංහල පැත්ත ඉදිරිපත් කරන්නට කෙනෙක් ඉදිරිපත් විය. ඒ එක්සත් රාජධානියේ සිංහළ සංගමයේ සභාපති ඩග්ලස් වික්‍රමරත්න මහතා ය.

ඩග්ලස් ශ්‍රීලංකාව ගැන විකාශනය වූ බීබීසී රූපවාහිනී සහ ගුවන්විදුලි සාකච්ඡාවලට නිරන්තරයෙන් සහභාගි වෙමින්, ඉතා චතුර ලෙස කතාකරමින්, ද්‍රවිඩ ප්‍රතිවාදීන් ගෙනා අසත්‍ය තර්ක සියල්ල බිඳහෙළීය. ඔහුගේ පැහැදිලි කිරීම් හමුවේ ද්‍රවිඩ කථිකයෝ බොහෝ විට දුර්මුඛ වූහ. ශිෂ්‍යයෙකුව සිටි සමයේ කොළඹ ආනන්ද විද්‍යාලීය විවාද කණ්ඩායම මෙහෙයවා පන්නරය ලැබ සිටි ඩග්ලස් ඕනෑම තර්ක විතර්කයකට සාර්ථකව මුහුණ දෙන අයුරු දනී. එසේම ශ්‍රීලංකාවේ ප්‍රශ්නය ද ඔහු මැනවින් අධ්‍යනයකර සිටි අතර, ඔහුගේ ඉංග්‍රීසි භාෂා හැසිරවීම ද විශිෂ්ට වීය. බීබීසීයේ පමණක් නොව ඔක්ස්පර්ඩ්, හා කේම්බ්‍රිජ් සරසවි පීඨයන්හි ද, ලන්ඩනයේ ආර්ථික විද්‍යා පාසැලේද, ( London School of Economics ) සන්රයිස් ගුවන්විදුලියේද සිංහල දෙමළ වාද විවාදයන් වීය. ඒ සියල්ලෙහි දී සිංහල පැත්ත ඉදිරිපත් කළේ ඩග්ලස් වික්‍රමරත්න මහතා ය. අද බොහෝ දෙනෙකුට ඒ යුගය මතකයෙන් ගිළිහී ඇතත් එදා ද්‍රවිඩ ඊළම්වාදීන්ගේ අවලාද වලින් සිංහල ජනතාව රැකගන්නට ඉදිරිපත්වීම ගැන සිංහල සංගමයේ සභාපතිවරයාට සියළු ජාති හිතෛෂීන්ගේ නොමඳ ගෞරවය හිමිවිය යුතුය.

ඒ යුගයේ සිට මේ දක්වා එක්සත් රාජධානියේ සිංහල සංගමය විසින් කරන ලද කාර්‍යයන් අතර ලන්ඩනයේ සංවිධානය කළ උද්ඝෝෂණ බොහෝ ය. එසේම ලන්ඩන් ටෛම්ස්හි පත්‍රකලාවේදිනියක් වන පෙනිලොපී ට්‍රිමේන් හා ලෝක ත්‍රස්ත විරෝධී සංවිධානයේ ඉයන් ගෙල්ඩාඩ් ආදී කථිකයන් ගෙන්වා ලන්ඩනයේ බොහෝ තන්හි දෙමළ ජාතිවාදීන්ට එරෙහිව පැවැත්වූ රැස්වීම් ද ගණනාවකි. සිංහල සංගමයෙන් වූ සේවය ලෙහෙසියෙන් අමතක කළ හැකි නොවේ. අප රටට වැඩ දායක තවත් බොහෝ දේශ හිතෛෂී ශ්‍රී ලාංකික සංගම් එංගලන්තයේ හා යුරෝපයේ බිහිවන්නට ආදර්ශයක් වූයේ ද සිංහල සංගමයයි.

අවසන් වශයෙන්, වසර **30** ක් පිරුණ එක්සත් රාජධානියේ සිංහළ සංගමයට තව දීර්ඝ කාලයක් පුරා අප සිංහළ සමාජයට ද, සමස්ථයක් ලෙස ශ්‍රීලංකාවට ද සේවයක් සැළසීමට හැකිවේවායි පතමින් ද, එම සංගමයට සම්බන්ධ සියළු මහත්ම මහත්මීන්ට අපේ හෘදයාංගම ශුභාශිංසන පිරිනමමින් ද මේ සටහන අවසන් කරමු.

**ජයවේවා !**

♦ *දයා ආනන්ද රණසිංහ*

# හෙළ දරු වරුණ

## දරුවන්ගේ මහා කලා මංගලයය

මව්බිමෙන් හැතැප්ම දහස් ගණනක් දුරින් සිටින ශ්‍රී ලාංකික අපට අපේකම ගැන සිතන්නට, කථා කරන්නට ලැබෙන ඉඩ ප්‍රස්ථා විරලය. ඊට ප්‍රධානතම හේතුව අප සියළුම දෙනා කාර්යය බහුලව සිටීමයි. ලොව අද්විතීය සංස්කෘතියකට උරුම ලද්දන් වීමට තරම් අපි භාග්‍යයවන්තයෝ වීමු. එහෙත් එවන් උදාර සංස්කෘතික පසුබිමක හවුල්කරුවන් වූවත්, දියුණුයයි හඳුන්වන අද ලෝකය තුළ ජීවත් වන අප අපේ සංස්කෘතියට සිදුකරගන්නා වූ හානි ඉතා ශෝචනීයය.

අපේ මුතුන් මිත්තන් දේශීය සංස්කෘතිය, ජාතිය හා ආගම රැක ගන්නටත් පෝෂණය කරන්නටත් දිවි හිමියෙන් කටයුතු කළ පිරිසක් බව ඉතිහාසය පෙන්නා දෙයි. එම සංස්කෘතික පසුබිම තුළ අහස උසට තැනූ වෙහෙර විහාර, මහා සාගරය වන් වැව් අමුණු, කෙළවරක් නොපෙනෙන සාරවත් කෙත් වතු මෙන්ම හෙළ චාරිත්‍ර වාරිත්‍ර ඇතුළු තවත් බොහෝ දෑ අපට උරුම කර දුන් දායාදයන්ය. වර්තමානයේ දියුණු නවීන යයි කියාගත් සිහින ලොවක ජීවත් වන අප අපේ අනන්‍යතාවය ලොවට කියා පාන්නට අදටත් ලෝකයා ඉදිරියේ ගෙන හැර දක්වන්නේ අපේ මුතුන් මිත්තන් විසින් අපට උරුම කළ ඒ වටිනා දායාදයන් පමණක් වීම කණගාටුවට කරුණකි.

මෑත ඉතිහාසයේ අපේ අනන්‍යතාව තහවුරු කරන්නට අප විසින් කරන ලද කිසියම් මෙහෙවරක් ගෙන හැර දක්වන්නට අපට නොහැකිය. එයට හේතුව වර්තමාන ලෝකය තුල අපේ සංස්කෘතිය විකාශය කරන්නට නොහැකිවීමේ දුර්වලතාවයද නැතහොත් අපගේ අනන්‍යයතාවය කුමක් දැයි හරිහැටි වටහා ගන්නට බැරිකම හෝ ඒ පිළිබඳ ඇති අවබෝධයේ අඩුකමද එසේත් නැතිනම් වෙනත් ප්‍රශ්නයක් ද යන්න වෙනමම සාකච්ඡාවට භාජනය කළ යුතු දෙයකි.

මෙහි ප්‍රතිඵලයක් ලෙස වර්තමාන තරුණ පරපුර තුළ කිසියම් වල්මත් වීමක් දැකිය හැකිය. ඔවුන් අද හෙළ සිරිත් විරිත්වලින් ඈත්ව, වැඩිහිටියන්ට ගරු කිරීම වැනි ඉතා වටිනා ගුණ ධර්ම නොසලකා හැර තිබෙන බවක් පෙනේ. මෙය ජාතියක් ලෙස අප පත්ව ඇති ඉතාම කණගාටුදායක තත්වයකි. මව් රටෙන් බැහැරව බටහිර රටක වෙසෙන මේ දරුවන් මේ අයුරින් හෙළ සිරිත් විරිත් සහ සංස්කෘතියෙන් ඈත්වීම තුළ ඉදිරියේ ඔවුන් කෙබඳු පුද්ගලයින් බවට පරිවර්තනය වේදැයි සිතීම පවා අප හද සසල කරවයි.

මේ සියල්ල ගැන සිතා එක්සත් රාජධානියේ වෙසෙන ශ්‍රී ලාංකීය දූ දරුවන් ඒකරාශිකර ඔවුන්ගේ හැකියා ලොවට කියාපාන්නට **හෙළ දරු වරුණ** නම් සුවිශේෂ සංස්කෘතික කලා මංගල්‍යයක් පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කර ඇත.

ප්‍රසංගයට සහභාගි වන දරුවන් වයස අවුරුදු 15 ට අඩු අය විය යුතු අතර ඔවුන් ශ්‍රීලංකා වෙන් පිටත උපත ලැබූ අය විය යුතු මෙන්ම එක්සත් රාජධානියේ පදිංචිව සිටිය යුතුය. ප්‍රසංගයේ සියළු දෑ එනම් කථනය ඉදිරිපත් කිරීම ඔවුන් විසින්ම සිංහලෙන් කරනු ලබනු ඇත. සිංහළ ජන ගී, ජන නැටුම්, වන්නම්, නාඩගම් ගී, වෙස් නැටුම්, පන්තේරු නැටුම්, තේරවිලි කවි, විරිදු ඇතුළු තවත් සංස්කෘතික අංග රාශියක් මෙම දරුවන් වෙතින් ඉදිරිපත් කෙරේ.

මේ මහා කලා මංගල්‍යය 2007 දෙසැම්බර් මස 08 වන සෙනසුරාදා සවස 3.00 සිට 7.00 දක්වා Lampton School, Lampton Avenue, Hounslow, Middlesex TW3 4EP හි දී පැවැත්වේ.

නොමිලයේ පැවැත්වෙන මෙම ප්‍රසංගයේ ඉඩකඩ ඉතා සීමිත බැවින් ආරාධනා පත් ලද අයට පමණක් නැරඹීමේ අවස්ථාව උදාකරගත හැක.

වැඩි විස්තර සඳහා **07894791159** අංකය අමතන්න.

**සංවිධායකවරු - හෙළ දරු වරුණ**

